—V

# UNIVERSITY GRANTS COMMISSION

**COMMISSION CIRCULAR NO.943**

No.20, Ward Place,
Colombo 07

17th January, 2011

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**REVISION OF SALARIES AND ALLOWANCES OF THE EMPLOYEES IN THE PUBLIC CORPORATIONS, STATUTORY BODIES, FULLY OWNED GOVERNMENT COMPANIES AND PROJECT STAFF ON BUDGET PROPOSALS -2011**

Your attention is invited to the existing salary scales applicable to the University Staff in Commission Circular No. 879 of 11.08.2006 and Establishments Circular Letter No. 12/2006 of 16.10.2006.

2. The Secretary of the Treasury and the Ministry of Finance & Planning has now issued the Management Services Circular No. 43 of 10.01.2011 providing provisions to pay a special allowance of 5% of the basic salary and revised Cost of Living Allowance on budget proposals in 2011. (Annexed)

3. The special allowance and cost of living allowance applicable to the University Staff based on the Management Services Circular No. 43 are given below:-

1st Step - From 01.01.2011:

1.1 Special Allowance

A special allowance equivalent to 5% of the basic monthly salary exclusive of allowances shall be paid to all permanent staff with effect from 01.01.2011.

1.2 Cost of Living Allowance

An amount of Rs. 5850/- shall be paid by adding Rs. 600/- to the Cost of Living Allowance of Rs. 5250/- paid at present to the officers serving in posts entitled to a salary scale of which the initial monthly salary is less than Rs. 24,725/- to be effective from 01.01.2011.

Contd..2/-

**2nd Step. – From 01.07.2011**

**Cost of Living Allowance**

An amount of Rs. 5850/- shall be paid by adding Rs. 600/- to the Cost of Living Allowance of Rs. 5250/- paid at present, to officers serving in posts entitled to a salary scale of which the initial monthly salary is Rs. 24,725/- and above, so as to be effective from 01.07.2011.

**Daily Wages**

An allowance equivalent to 5% of the daily wage exclusive of Cost of Living Allowance shall be paid to the employees serving on casual/ daily wage basis with effect from 01.01.2011.

The Cost of Living Allowance of Rs.175/- paid to the employees who are serving on daily paid basis shall be revised as Rs. 195/- and paid with effect from 01.01.2011.

3. Please take action accordingly.

(Prof. Gamini Samaranayake)
Chairman

Cc:
1. Chairman's Office/UGC
2. Vice-Chairman/UGC
3. Members of the UGC
4. Secretary/UGC
5. Deans of Faculties
6. Registrars of Universities
7. Financial Controller/UGC
8. Bursars of Universities
9. Librarians/ SAL/AL of the Higher Educational Institutions/ Institutes
10. Deputy Registrars/ Snr. Asst. Registrars/ Asst. Registrars of Campus /Institutes
11. Deputy Bursars/Snr .Asst. Bursars/ Asst. Bursars of Campuses/ Institutes
12. Chief Internal Auditor/UGC
13. Govt. Audit Superintendents of Universities
14. Snr. Asst. Int. Auditors/ Asst. Int. Auditors of HEIs
15. Secretaries of Trade Unions
16. Auditor – General

File No: UGC/HR/2/9/86 ( 12th vol.)

**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 43**

**මගේ අංකය : ඩීඑම්එස්/ඒ/08/21**
**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**
**මහා භාණ්ඩාගාරය**
**කොළඹ 01.**

2011.01.10

**අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ**
**සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්**

**<u>2011 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සංශෝධනය කිරීම</u>**

රජය විසින් ප්‍රකාශිත 2011 අයවැය යෝජනා මගින් රාජ්‍ය අංශයේ වැටුප් හා දීමනා සංශෝධනය කර ඇත. ඒ අනුව සාමූහික ගිවිසුම් මගින් වැටුප් තීරණය වන්නා වූ හෝ කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කොට ගත් විචල්‍ය ජීවනාධාර දීමනාවක් මාසිකව ලබන්නා වූ හෝ ඉදිරි වසර තුන සඳහා සාමූහික ගිවිසුම් මගින් හෝ ඒ ආකාරයේ අවබෝධයකින් වැටුප් වැඩි කිරීම් ලබා දුන් ආයතනවලට හැර අනෙකුත් රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මගින් ආවරණය වන ව්‍යාපෘති කාර්ය මණ්ඩලවල වැටුප් හා දීමනා සංශෝධන යෝජනා අදියර දෙකකින් ක්‍රියාත්මක කරනු ලැබේ. එහි පළමු අදියර 2011.01.01 දින සිටත්, දෙවන අදියර 2011.07.01 දින සිටත් ක්‍රියාත්මක වේ.

## 2. පළමු අදියර - 2011.01.01 දින සිට

### 2.1 විශේෂ දීමනාව

සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තමන් ලබමින් සිටින දීමනා රහිත මූලික මාසික වැටුපෙන් සියයට පහක (5%) විශේෂ දීමනාවක් ගෙවිය යුතුය.

නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමික නිලධාරීන්ට සහ කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා ඇති නිලධාරීන්ට මෙම දීමනාව හිමි නොවේ.

2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 අනුව වැටුප් හා දීමනා ලබන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයන්ද මෙකී දීමනාව ලැබීමට හිමිකම් ලබන අතර, එකී දීමනාව අදාල නිලධාරියා ලබමින් සිටින දීමනා රහිත මූලික මාසික වැටුපෙන් සියයට පහක් (5%) විය යුතුය.

## 2.2 ජීවන වියදම් දීමනාව

ආරම්භක මාසික වැටුප රු.24725/-ට වඩා අඩු වැටුප් පරිමාණයන් හිමි තනතුරුවල සේවය කරන සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දැනට ගෙවනු ලබන රු.5250/-ක මාසික ජීවන වියදම් දීමනාවට රු.600/-ක් එකතු කොට රු.5850/-ක් වශයෙන් ගෙවිය යුතුය.

ව්‍යාපෘති කාර්ය මණ්ඩල පත්කිරීම් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් වූ 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි 4.2.1 හි A, B සහ C කාණ්ඩවලට අයත් නොවන සෙසු නිලධාරීන් සඳහා ද 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දැනටමත් ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාවට රු.600/-ක් එකතු කොට රු.5850/-ක් වශයෙන් ගෙවිය යුතුය.

## 3. දෙවන අදියර - 2011.07.01 දින සිට

### ජීවන වියදම් දීමනාව

ආරම්භක මාසික වැටුප රු.24725/- සහ ඊට වැඩි වැටුප් පරිමාණයන් හිමි තනතුරුවල සේවය කරන සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා 2011.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි දැනට ගෙවනු ලබන රු.5250/-ක මාසික ජීවන වියදම් දීමනාවට රු.600/-ක් එකතු කොට රු.5850/- ක් වශයෙන් ගෙවිය යුතුය.

ව්‍යාපෘති කාර්ය මණ්ඩල පත්කිරීම් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් වූ 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි 4.2.1 ඡේදයේ A, B සහ C කාණ්ඩ යටතට ගැනෙන නිලධාරීන් සඳහා 2011.07.01 දින සිට බලපැවැත්වෙන පරිදි දැනට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාවට රු.600/-ක් එකතු කොට රු.5850/-ක් වශයෙන් ගෙවිය යුතුය.

## 4. දෛනික වේතනය

4.1 අනියම්/දෛනික වැටුප්ලාභී පදනම යටතේ සේවය කරන සේවකයන්ට ගෙවනු ලබන දෛනික වේතනය (ජීවන වියදම් දීමනාව හැර) මත 5% ක දීමනාවක් 2011.01.01 දින සිට ගෙවිය යුතුය.

4.2 අනියම්/දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා දැනට ගෙවනු ලබන රු.175/- ක ජීවන වියදම් දීමනාව දිනකට රු.195/- බැගින් වන සේ සංශෝධනය කොට 2011.01.01 දින සිට ගෙවිය යුතුය.

5. **සාවද්‍ය ගණනය කිරීම්**

**මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීමේ හේතුවෙන් හෝ ලියවිලිවල හෝ ගණනය කිරීමේදී ඇතිවන මොනයම් වැරදීමක් හේතුවෙන් කිසියම් තැනැත්තෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම්, එසේ වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී. එවැනි සාවද්‍ය වැටුප් පරිවර්තනයන් සිදුකරන වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට අදාල බලධාරීන් කටයුතු කළ යුතු වේ.**

6. මෙම චක්‍රලේඛය පිළිබඳව කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ.කේ.එන්. වික්‍රමසිංහ මහතා (දුරකථන අංකය 2484758) අමතන ලෙස කාරුණිකව දන්වමි.

පී.බී.ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
5. විගණකාධිපති